# ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම - 2019
# උපදෙස් සංග්‍රහය

1. 2019 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ආකෘතිය මගින් පමණක් ස්ථාන මාරුවීම සඳහා ඉල්ලුම් කිරීම අනිවාර්ය වන අතර වෙනත් ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් වන ඉල්ලීම් ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා අදාළ කරගනු නොලැබේ. මෙම ඉල්ලුම්පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශ www.moe.gov.lk වෙබ් අඩවිය ඔස්සේ බාගත කර ගත හැකිය.

## 2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2018/07/25

ගුරු භවතුන් විසින් ස්ථාන මාරු ඉල්ලීමේ දී පහත ආකෘතිපත්‍ර අදාළ කරගත යුතු වේ.

- **C-2019** - 2018.06.30 දින හෝ ඊට පෙර දැනට සේවය කරන පාසලේ සේවාකාලය වර්ෂ 10 සම්පූර්ණ කළ ගුරු භවතුන් සඳහා
- **NP-2019** - පළාත් සභා සේවයට නිදහස් වීමට බලාපොරොත්තු වන්නේ නම් අයදුම්පත්‍රය සමඟ මෙම ආකෘතිය සම්පූර්ණ කර අමුණා එවිය යුතුය.
- **TA – 2019** - ජාතික පාසල් වාර්ෂික ගුරු ස්ථාන මාරු අයදුම්පත .

3. ගුරුභවතුන්ගේ සියලු වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් විදුහල්පති මගින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. එබැවින් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර (2018/07/25) අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමට හැකිවන පරිදි කල් වේලා ඇති ව තම ඉල්ලුම්පත් විදුහල්පති වෙත භාර දීම ගුරුභවතුන්ගේ වගකීම වනු ඇත.

4. **ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක් ම විදුහල්පතිගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතු බැවින් , සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පත් කල්වේලා ඇතිව විදුහල්පති වෙත බාරදිය යුතුය. පෞද්ගලිකව අමාත්‍යාංශය වෙත එවනු ලබන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.**

5. ගුරුභවතුන් තම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය සමග මුල්පත්වීම් ලිපියේ පිටපතක්, දැනට සේවය කරනු ලබන පාසලට පත් කිරීමට අදාළ පත්වීම් ලිපියේ හෝ ස්ථාන මාරු ලිපියේ පිටපතක්, තම පෞද්ගලික කාලසටහනේ පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතු වේ. කිසියම් ගුරුභවතෙකු වෙනත් පාසලක් වෙත අනුයුක්තව සේවය කරයි නම් අනුයුක්ත කිරීම් ලිපියේ පිටපතක් ද ස්ථාන මාරු අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු වේ.

II ස්ථාන මාරුවීමට අදාළ වන්නේ වෛද්‍ය හේතුවක් නම් තම පෞද්ගලික අභියාචනය වෛද්‍ය සහතිකය සමඟ අයදුම්පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතු වේ. වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේ දී පිළිගත් රජයේ වෛද්‍යවරයකු විසින් අදාළ රෝගී තත්ත්වය සනාථ කරමින් ඉදිරිපත් කරන වෛද්‍ය සහතික පමණක් පිළිගනු ලැබෙන අතර ඖෂධ වට්ටෝරු හෝ සායනික සටහන් හා විවිධ වෛද්‍ය පරීක්ෂණ වාර්තා වෛද්‍ය සහතික ලෙස භාරනොගන්නා බව අයදුම්කරුවන් විසින් සැලකිය යුතු ය.

III ඉහත I හා II යටතේ යොමු කරන ලද ලියවිලි හැර වෙනත් බාහිර පාර්ශවයන්ගේ නිර්දේශ සහිත ලිපි අයදුම්පත්‍රයට ඈමිණීමෙන් වැළකී සිටින ලෙස දන්වා සිටිමි. එසේ අමුණා එවීමෙන් විශේෂ වරප්‍රසාදයක් හිමි නොවන බව ද සැළකිය යුතුය.

6. **අයදුම්පත්‍රයට ඈමිණීම සඳහා 05 හි සඳහන් අතිරේක ලිපි ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වරින් වර ඉදිරිපත් කිරීම ගුරුභවතුන් විසින් සිදු නොකළ යුතු අතර, අයදුම්පත්‍රය සමග නොඑවන අතිරේක ලේඛන මාරු මණ්ඩල සඳහා යොමු වීමක් සිදු නොකෙරේ.**

7. ස්ථාන මාරු ඉල්ලුම්කරනු ලබන්නේ ජාතික පාසල් අතර ද නොඑසේ නම් ජාතික පාසල් සේවයෙන් පළාත් රාජ්‍ය සේවයට යන වග වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය ආරම්භයේ දී පැහැදිලිව සලකුණු කළ යුතු ය.

8. තම මනාපයේ අනුපිළිවෙළට පහසු පාසල් 5 ක් ඉල්ලුම්පත්‍රයේ සටහන් කිරීම ගුරුභවතුන් විසින් සිදු කළ යුතු වේ. එක් පාසලක් පමණක් සටහන් කිරීම ස්ථාන මාරු ලබා ගැනීම සඳහා ඇති අවස්ථා අවම වීමට බලපානු ඇත.

9. **වරක් ස්ථාන මාරු අයදුම්පතක් ඉදිරිපත් කළ පසු නැවත නැවත අදාළ අයදුම්පත්‍රයේ පිටපත් හෝ නව අයදුම්පතක් ඉදිරිපත් කිරීම ගුරුභවතුන් විසින් නොකළ යුතු අතර විදුහල්පති විසින් නැවත නැවත එවැනි ඉල්ලුම්පත් නිර්දේශ කිරීම නොකළ යුතුය.** එසේම ඔබ විසින් ජාතික පාසල් ඉල්ලුම් කරන්නේ නම් එක් අයදුම්පතක් ද පළාත් පාසල් ඉල්ලුම් කරන්නේ නම් අයදුම්පත් 4 ක් ද වශයෙන් පමණක් අයදුම්පත් එකවර ඉදිරිපත් කළ යුතුය.

II. පළාත් පාසල් ඉල්ලුම් කරන්නේ නම් ඔබගේ අයදුම්පත සමඟ,
- මුල් පත්වීම් ලිපියේ සහතික කළ පිටපත
- සේවයේ ස්ථිර කිරීමේ ලිපියේ සහතික කළ පිටපත
- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් නිකුත් කරනු ලබන විනය හා විගණන විමසුම් නොමැති බවට වූ ලිපිය යන ලිපිවලින් සමන්විත අයදුම්පත් කට්ටල 04 ක් ඉදිරිපත් කල යුතුය.

10. **අයදුම්පත් නියමිත දිනට පෙර භාරදීම / පැහැදිලිව නිවැරදිව, සම්පූර්ණ කිරීම හා අදාළ ඇමුණුම් සමඟ ඉදිරිපත් කිරීම ගුරුභවතුන්ගේ මෙන්ම විදුහල්පතිගේ වගකීම වනු ඇත. විදුහල්පතිගේ ආවරණ ලිපියට බැහැරව කිසිදු අයදුම්පත්‍රයක් භාර නොගන්නා අතර අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව අවලංගු අයදුම්පත්‍රයක් ලෙස සලකා කටයුතු කරනු ඇත.**

2018/6/29

පී.එන්.අයිලප්පෙරුම
අධ්‍යාපන අධ්‍යක්ෂ
(ජාතික පාසල් ගුරු ස්ථාන මාරු)
අධ්‍යාපන ලේකම් වෙනුවට
අධ්‍යාපන අමාත්‍යාංශය